මෙම ප්‍රශ්නපත්‍රයෙහි
I කොටස පිළිතුරු
පත්‍රය සමග අමුනා යැවිය යුතු
බැවින් මෙහි අඩංගු නොවේ.
අප එය උත්තර පත්‍ර පරීක්ෂාවෙන්
පසු එම කොටසත් ඇතුලත් කර
යවත්කාලීන කරන අතර. ඔබට එය
තව සති කිහිපයකින් අප වෙබ්
අඩවියට පිවිසීමෙන් ලබාගැනීමට
හැකිවනු ඇත.

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ඉංජිනේරු/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඇත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) මාගම (ii) දීඝවාපී (iii) ජජ්ජර නදී (iv) යෝධවැව
(v) මිහින්තලේ (vi) කලාවැව (vii) යාපහුව (viii) කළු ගඟ
(ix) කටුගස්තොට (x) ත්‍රිකුණාමලය (xi) මිණිපේ (xii) උතුරු මැද පළාත

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** "පුරාතන ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය වාර්තා කොට ඇති වැදගත්ම වංසකථාව මහාවංසයයි"

(i) මහාවංසයේ පළමුවන කොටසේ කතුවරයා වාසය කළ පිරිවෙන නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) මහාවංසයේ පළමුවන කොටසේ සඳහන් වන අවසාන පාලකයා නම් කරන්න. (ලකුණු 01 යි)
(iii) අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසය කෙතරම් වැදගත් වන්නේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)
(iv) අනුරාධපුර යුගයේ ආර්ථික ක්‍රමය හැදෑරීම සඳහා මහාවංසය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

**3.** (i) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයේ දී බුදුදහම් ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)
(ii) අනුරාධපුර යුගයෙහි දී බුදු සමයේ හා භික්ෂු ශාසනයේ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් ගෙනහැර දක්වන්න. (ලකුණු 08 යි)

**4.** "පළමුවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමය පුරාතන ශ්‍රී ලාංකේය වාරි කර්මාන්තයෙහි වර්ධනයේ උච්චස්ථානය සලකුණු කරයි."

(i) අනුරාධපුර යුගයේ දී විශාල පරිමාණයේ වැව් ඉදිකළ පාලකයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) අනුරාධපුර යුගයේ දී ඉදිකරන ලද පැළ මාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය වර්ධනය කිරීමෙහි ලා ඉටු කරන ලද කාර්යභාරය විචාරාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 12 යි)

අවවැනි පිටුව බලන්න.

Alevel Lanka උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වසභ රජතුමා

(ii) මාඝ ආක්‍රමණය

(iii) කුරුණෑගල යුගය

(iv) සපුමල් කුමාරයා

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් සිය බලය ස්ථාපිත කරගත් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "දෙවන රාජසිංහ රජු මිරිස් දී ඉඟුරු ගත්තේ ය."

(i) දෙවන රාජසිංහ ළමා කාලයේ දී හැඳින්වූ නම කුමක් ද? (ලකුණු 01 යි)

(ii) දෙවන රාජසිංහ රජුගේ පියා සහ මව නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) උඩරට රජු සහ ලන්දේසීන් අතර අත්සන් කරන ලද 1638 ගිවිසුම සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට එරෙහිව දෙවන රාජසිංහ රජු අනුගමනය කළ ප්‍රතිපත්තිය විස්තර කිරීමට ඉහත සඳහන් උධෘතය කෙතෙක් දුරට යෝග්‍ය දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** දහනව වන සියවසේ දී ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ වර්ධනය සඳහා බලපා ඇති ප්‍රධාන සාධක පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය

(ii) ඉඩම්

(iii) ශ්‍රමය (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පෘතුගීසීන් අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තිය

(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර පැවති සබඳතා

(iii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කර ගැනීම

(iv) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක

(ලකුණු 08 × 2 = 16 යි)

www.alevelapi.com

* * *

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.